பிரதிப் பிரதம செயலாளர் அலுவலகம் (நிருவாகம்) – கிழக்கு மாகாணம்
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය (පරිපාලන) - නැගෙනහිර පළාත
OFFICE OF THE DEPUTY CHIEF SECRETARY (ADMINISTRATION) - EASTERN PROVINCE

எனது இல. / මගේ අංකය. / My No. EP/02/CMA
உமது இல. / ඔබේ අංකය. / Your No.
திகதி. / දිනය. / Date. 2014.11.18

පළාත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : DCS(A)/06/2014

ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ආයතන ප්‍රධානීන්,

**නැගෙනහිර පළාත් කළමනාකරණ සහකාර III ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීමේ කාලය දීර්ඝ කිරීම**

ඉහත කරුණ සම්බන්ධයෙන්, නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක EP/07/03/Gen හා 2014.09.02 වැනි දින දරණ ලිපිය හා බැඳේ.

02) 2003.03.03 වැනි දින නැගෙනහිර පළාත් කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට පත්වීම් ලැබ සිටින නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ පරිගණක පරීක්ෂණය නියමිත කාලවලදී නොපැවැත්වීම හේතුවෙන් පරිගණක පරීක්ෂණයෙන් සමත්වීම සඳහා 2009.07.26 දින දක්වා කාලය දීර්ඝ කරනු ලබන බව දන්වා සිටිමි.

03) ඒ අනුව 2003.03.03 දින පත්වීම් ලැබූ නිලධාරීන්ට 2009.07.26 වැනි දින දක්වා වැටුප් වර්ධක උපයා ගත හැකි බව දන්වා සිටින අතර, නියමිත දිනට පසුව සමත් වන නිලධාරීන්ගේ වැටුප් වර්ධක විලම්භනය වන අතර, සමත් වන දින සිට වැටුප් වර්ධක උපයාගත හැකි බවද දන්වා සිටිමි.

04. එබැවින් ඉහත සඳහන් පරිදි 2003.03.03 දින පත්වීම් ලැබූ නිලධාරීන් පරිගණක පරීක්ෂණය සමත් නොවීම මත 2009.07.21 දින දක්වා අත්හිටුවන ලද වැටුප් වර්ධක ලබාදී, චර්යා සටහන යාවත්කාලීන කරන ලෙස දන්වනු ලැබේ.

**කලාමදි පද්මරාජා**
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්-පරිපාලන
නැගෙනහිර පළාත

පිටපත්:-
01. ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, නැගෙනහිර පළාත
02. ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත

கன்னியா வீதி, வரோதய நகர், திருகோணமலை.
කන්නියා පාර, වරෝදය නගර්, ත්‍රිකුණාමලය.
Kanniya Road, Varothaya Nagar, Trincomalee.

Gen. Office I : 026 2224049
Gen. Office II : 026 2222114
Admin Officer : 026 3269885
Deputy Chief Secretaty : 026 2222703
Assistant Chief Secretaty I : 026 3269883
Assistant Chief Secretaty II : 026 2222593
Fax : 026 2227161
Web :www.ep.gov.lk
E-mail : admin@ep.gov.lk